# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2380/31 - 2024 අප්‍රේල් මස 19 වැනි සිකුරාදා - 2024.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 අප්‍රේල් මස 04 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II,
බත්තරමුල්ල.

1A - G 41787— 49 (2024/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය 1

හඟුරන්කෙත නාගරික සංවර්ධන බල ප්‍රදේශය

*I වැනි තීරුව*

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 494 දමුණුමැය, අංක 495 හඟුරන්කෙත, අංක 494E දමුණුමැය උතුර, අංක 495D, දෙල්ගහපිටිය, අංක 496B අරත්තන, අංක 492C වළලවෙල, අංක 493 මාදන්වෙල හා අංක 495C පල්ලේමළුව යන ග්‍රාම නිලධාරී කොට්ඨාසද අංක 495A පුස්සලමංකඩ, අංක 492 දියඋඩගම, අංක 493A, කොට්ටල හා අංක 495B යටිහඟුරන්කෙත යන ග්‍රාම නිලධාරී කොට්ඨාස වල කොටස් වලින් සමන්විත දෙවන තීරුවෙහි විස්තර වන්නාවූ මායිම් හා ඉම් වලින් සමන්විත මුළු මහත් භූමි ප්‍රමාණයද වේ.

*II වැනි තීරුව*

*උතුරට :*

අංක 495D දෙල්ගහපිටිය ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හා අංක 495A පුස්සලමංකඩ ග්‍රාම නිලධාරී වසමේ ගිනිකොණ දිග මායිම හමුවන ජෝර්ජ් අබේගුණසේකර මාවතෙහි මධ්‍ය රේඛාව ආරම්භක ලක්ෂ්‍යය ලෙස ගෙන (01), එතැන් සිට අංක 495D දෙල්ගහපිටිය, ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඔස්සේ ගිනිකොණ දෙසට ගමන්කොට එතැන් සිට හමුවන හඟුරන්කෙත අධිකාරිගම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිනිකොණ දෙසට ගමන්කොට (02) අංක 495 හඟුරන්කෙත ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද (03) එතැන් සිට එම ග්‍රාම නිලධාරී වසමෙහි මායිම ඔස්සේ දකුණ ගිනිකොණ දිශානුගතව ගමන් කොට අංක 494A කොට්ටල ග්‍රාම නිලධාරී වසමෙහි උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද (04),

*නැගෙනහිරට :*

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 493A කොට්ටල ග්‍රාම නිලධාරී වසමෙහි උතුරු ඊසාන මායිම ඔස්සේ ගමන් කොට එතැන් සිට කොට්ටල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණ - නිරිත, ගිනිකොණ දෙසට ගමන් කර අංක 492 දියඋඩගම ග්‍රාම නිලධාරී වසමෙහි ඊසාන මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද (05), එතැන් සිට හමුවන වලුගම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණට, නැගෙනහිරට, ගිණිකොණට හා නිරිත දිශානුගතව ඇඳි රේඛාව ඔස්සේ ගමන්කොට අංක 492C වලලවෙල ග්‍රාම නිලධාරී වසමෙහි ගිනිකොණ මායිමේ හමුවන ලක්ෂ්‍යය දක්වාද (06), එතැන් සිට අංක 492C වලලවල ග්‍රාම නිලධාරී වසමෙහි ගිනිකොණ දකුණ බටහිර, දිශානුගතව ඇඳි රේඛාව ඔස්සේ ගමන් කොට තැන්නේකුඹුර - රිකිල්ලගස්කඩ - රාගල ප්‍රධාන මාර්ගය ඡේදනය වන මධ්‍ය ලක්ෂ්‍යය හමුවන ස්ථානය දක්වාද (07) එතැන් පටන් අංක 492C වලලවෙල ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම ඔස්සේ නිරිත, වයඹ දිශානුගතව ඇඳි රේඛාව අංක 493 මාදන්වෙල ග්‍රාම නිලධාරී වසමෙහි දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද (08),

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 493 මාදන්වෙල ග්‍රාම නිලධාරී වසමෙහි බටහිර මායිම ඔස්සේ වයඹ නැගෙනහිර දිශානුගතව ඇඳි රේඛාව අංක 494 දමුණුමැය ග්‍රාම නිලධාරී වසමෙහි බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද (09),

*බටහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 494 දමුණුමැය ග්‍රාම නිලධාරී වසමේ වයඹ, ඊසාන, බටහිර දිශානුගතව ඇඳිරේඛාව අංක 494E දමුණුමැය උතුර ග්‍රාම නිලධාරී වසමෙහි දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා (10) ගමන්කර එතැන් සිට එම ග්‍රාම නිලධාරී වසමෙහි බටහිර මායිම වයඹ ඊසාන බටහිර දිශානුගතව ඇඳි රේඛාව ඔස්සේ ගමන්කොට අංක 496B අරත්තන ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද (11), එතැන් පටන් එහි වයඹ මායිම ඔස්සේ උතුරු බටහිර ඊසාන දිශානුගතව ගමන්කොට අංක 495B

යටිහඟුරන්කෙත ග්‍රාම නිලධාරි වසමේ ගිනිකොණ මායිමේ දික්හින්න මාර්ගය ඡේදනය වන මධ්‍ය ලක්ෂ්‍යයේ සිට (12) එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගමන් කර අංක 695A පුස්සල මංකඩ ග්‍රාම නිලධාරි වසමේ නිරිත දිග මායිම ඡේදනය වන මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද (13) එතැන් පටන් එම ග්‍රාම නිලධාරි වසමේ වයඹ, ඊසාන දිශානුගතව ගමන් කර ජෝර්ජ් අබේගුණසේකර මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ ගමන් කර ආරම්භක ලක්ෂ්‍යය හමුවන ස්ථානය දක්වා ආවරණය වන සියළු භූමි ප්‍රදේශයන් අයත් වේ.

EOG 04 - 0159

---

## 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

### 3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 අප්‍රේල් මස 09 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II,
බත්තරමුල්ල.

### උපලේඛනය 1

### නාවලපිටිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1980.08.04 දිනැති අංක 100/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව, නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය නාගරික සංවර්ධන බල ප්‍රදේශයට අයත් වන්නා වූ අංක 1085 නාවලපිටිය නැගෙනහිර, අංක 1088 නාවලපිටිය බටහිර, අංක 1087 නාවලපිටිය උතුර, අංක 1086 නාවලපිටිය දකුණ, අංක 1105 වරකාව කොටසක්, අංක 1083 බව්වාගම කොටසක්, අංක 1084 ඉඹුල්පිටිය කොටසක්ද යන ග්‍රාම නිලධාරි කොට්ඨාස වලට අමතරව අංක 1107 කරහඳුන්ගල, අංක 1097 කෙන්දොපිටිය, අංක 1104 පල්ලේගම, අංක 1096 වැලිගම්පොල, අංක 1102 වැලිගොඩවත්ත යන ග්‍රාම නිලධාරි කොට්ඨාස සහ අංක 1105 වරකාව ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අංක 1083 බව්වාගම ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අයත් වන්නා වූ මෙහි II වන තීරුවෙන් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය වේ.

*II වැනි තීරුව*

*උතුරට :*

අංක 1102 වැලිගොඩවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම සහ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යයෙන් ආරම්භව එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ගමන් කර අංක 1104 පල්ලේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හමුවන වන ලක්ෂ්‍යය තෙක්ද, එතැන් සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ගම්පොල - නාවලපිටිය මාර්ගය (AB13) ඡේදනය කරමින් නැගෙනහිර දෙසට ගමන් කර මහවැලි ගඟේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද,

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 1104 පල්ලේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම වන මහවැලි ගඟේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු සහ නිරිත දෙසට ගමන් කර අංක 1105 වරකාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන වන ලක්ෂ්‍යය තෙක්ද, එතැන් සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම

වන මහවැලි ගඟේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දෙසට ගමන්කර අංක 1085 නාවලපිටිය නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය තෙක්ද, එතැන්සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම වන මහවැලි ගඟේ මධ්‍යරේඛාව ඔස්සේ දකුණු දෙසට නාවලපිටිය - කොත්මලේ මාර්ගය (B506) ඡේදනය කරමින් අංක 1084 ඉඹුල්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිමේ ඇති කඩියල්ලෙන ඔය සහ මහවැලි ගඟ එකිනෙකට හමුවන වන ලක්ෂ්‍යය තෙක්ද, එතැන්සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම වන මහවැලි ගඟේ මධ්‍ය රේඛාව ඔස්සේ මීටර් 1,075 ක් දකුණු දෙසට ගමන් කර එතැන් සිට මනඃකල්පිත රේඛාවක් මගින් නැගෙනහිර දිශාවට ගඟ ඡේදනය කර මහවැලි ගඟට ලම්භකව නැගෙනහිර දෙසට පිහිටා ඇති අඩි පාර ඔස්සේ අංක 1084 ඉඹුල්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුලින් ගමන් කර අංක 1083 දරන බව්වාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම වන නාවලපිටිය - පතන මාර්ගයේ (B317) මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය තෙක්ද, එතැන්සිට නාවලපිටිය - පතන මාර්ගයේ (B317) මධ්‍ය රේඛාව ඔස්සේ එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන්සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ පිළිවෙලින් ගිනිකොණ, නිරිත, නැගෙනහිර හා නැවතත් ගිනිකොණ දිශානුගතව ගමන් කර අංක 1099 දරන ඉඟුරු ඔය උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද,

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 1083 බව්වාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ නිරිත දිශාවට ගමන් කර එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම වන මහවැලි ගඟේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දිශානුගතව අංක 1097 කැන්දෝපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨසයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය තෙක්ද, එතැන්සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ නිරිත දිශානුගතව අංක 1101 මපාකන්ද උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය පසු කරමින් අංක 1094 දරන දෙකිඳ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද,

*බටහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 1097 කැන්දෝපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට අංක 1093 අලුත්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය පසුකරමින් ගමන් කර අංක 1096 වැලිගම්පොළ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන්සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ උතුරු, නිරිත හා වයඹ දිශාවට ගමන්කර එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම වන මහවැලි ගඟේ මධ්‍ය රේඛාව හමුවන තෙක්ද, එතැන්සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව අංක 1107 කරහඳුන්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක්ද, එතැන් සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ සහ අනතුරුව උතුරු මායිම වන නාවලපිටිය - ගිනිගත්හේන (B319) මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 1086 නාවලපිටිය දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක්ද, එතැන්සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ අංක 1102 වැලිගොඩවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන වන ලක්ෂ්‍යය තෙක්ද, එතැන්සිට එම ග්‍රාම නිලධාරි

කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ උතුරු, නැගෙනහිර සහ නැවතත් උතුරු දිශානුගතව ආරම්භක ලක්ෂ්‍යය දක්වාද ඇතුළත් මුළු ප්‍රදේශයම වේ.

EOG 04 - 0160

---

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 අප්‍රේල් මස 04 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II,
බත්තරමුල්ල.

**උපලේඛනය 1**

**හැටන් නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම**

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1980.08.04 දිනැති අංක. 100/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව නුවරඑළිය දිස්ත්‍රික්කයේ හැටන් නාගරික ප්‍රදේශයට කොටසක් වශයෙන් අයත් වන්නා වූ, අංක 319B හැටන් උතුර ග්‍රාම නිලධාරි වසමද, අංක 319C හැටන් බටහිර ග්‍රාම නිලධාරි වසමද, අංක 319D හැටන් දකුණ ග්‍රාම නිලධාරි වසමද, අංක 319E හැටන් නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමද, අංක 319 දික්ඔය දකුණ ග්‍රාම නිලධාරි වසම හා අංක 319A දික්ඔය ග්‍රාම නිලධාරි වසම් වලට අමතරව අංක 319B හැටන් උතුර ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 319C හැටන් බටහිර ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 319D හැටන් දකුණ ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 319E හැටන් නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 319 දික්ඔය දකුණ ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 319A දික්ඔය ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 319H නිව්වැලිගම ග්‍රාම නිලධාරි වසමේ කොටසක් ද, අංක 320G රුවන්පුර ග්‍රාම නිලධාරි වසමේ කොටසක් ද, අංක 319J වනරාජා ග්‍රාම නිලධාරි වසම, අංක 320R

*II වැනි තීරුව*

*උතුරට :*

අංක 320G රුවන්පුර ග්‍රාම නිලධාරි වසමේ ගිනිකොණ මායිම සහ අංක 475A කුඩාඔය ග්‍රාම නිලධාරි වසමෙ නිරිතදිග මායිම හමුවන අවිස්සාවෙල්ල - හැටන් - නුවරඑළිය (A7) ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ආරම්භක ලක්ෂ්‍යය ලෙස ගෙන, එතැන් සිට අංක 320G රුවන්පුර ග්‍රාම නිලධාරි වසමේ ගිනිකොණ මායිම 319C හැටන් බටහිර ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට 319C හැටන් බටහිර ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට 319B හැටන් උතුර ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද එතැන් සිට 319B හැටන් උතුර ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට 319I ඇන්ෆිල්ඩ් ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද,

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 319I ඇන්ෆිල්ඩ් ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කරන මායිම 319L ඉන්ජස්ට්‍රි ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන්සිට 319A දික්ඔය ග්‍රාම නිලධාරි වසමේ නිරිත දිග මායිම ඔස්සේ 319J වනරාජා ග්‍රාම නිලධාරි වසමේ

පැන්මූර් ග්‍රාම නිලධාරි වසම සහ අංක 320O ෂැනන් ග්‍රාම නිලධාරි වසම ද ඇතුළත් වන්නාවූ මුළු මහත් ප්‍රදේශයම ඇතුළත් වේ.

නැගෙනහිර මායිම 319H නිව්වැලිගම ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට හමුවන දියසිරිගම මාර්ග යේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දකුණ බටහිර දෙසට ගමන් කර හැටන් මස්කෙළිය ඩල්හවුස් (B149) මාර්ගය ඡේදනය වන ලක්ෂ්‍යය දක්වාද, එතැන්සිට කාසල්රි ජලාශය හරහා බටහිර දෙසට අඳින ලද රේඛාව 319H නිව්වැලිගම ග්‍රාම නිලධාරි වසමේ වයඹ මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද,

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට 319J වනරාජා ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ ඊසාන දෙසට 319E හැටන් නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට 319E හැටන් නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට 319C හැටන් බටහිර ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද,

*බටහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට 320O ෂැනන් ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කරන මායිම 320R පැන්මූර් ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට 320R පැන්මූර් ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට 320G රුවන්පුර ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට 320G රුවන්පුර ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කරන මායිම සහ දකුණු දෙසට දිවෙන සිත්තර වත්ත මාර්ගය හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට එකී සිත්තර වත්ත මාර්ගය දිගේ ගමන් කර රුවන්පුර මාර්ගය හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට රුවන්පුර මාර්ගය අංක 320G රුවන්පුර ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට 320G රුවන්පුර ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට ආරම්භක ලක්ෂ්‍යය හමුවන ස්ථානය දක්වාද වේ.

EOG 04 - 0161